# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## හම්බන්තොට ධීවර වරායේ කැණිම්කර ගොඩගසා තිබෙන වැලි කියුබ් 300 ක් විකිණීම සඳහා මිළ ගණන් කැඳවීම

## CFHC/PD/SAND/HAM/2022/101

හම්බන්තොට ධීවර වරායේ කැණිම් කර ගොඩ ගසා තිබෙන වැලි කියුබ් 300ක් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් 2022/12/22 දින ප:ව 2.00 දක්වා කැඳවනු ලැබේ.වැලි ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ඔබ විසින්ම සපයා ගතයුතුය.

අදාල මිළ ගණන් ඉදිරිපත් කිරීම සඳහා වන ලංසු පත්‍රිකා සඳහා රු 1000.00 ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තුවක් සහ ආපසු ගෙවනු ලබන රු 5000.00 ක මුදලක් සංස්ථා ප්‍රධාන කාර්යාලයේ /වරාය කළමණාකාර හම්බන්තොට මුදල් භාරකරුවන් වෙත කාර්යාල දිනයන්හි පෙ:ව 9.00 සිට ප:ව 3.00 දක්වා ගෙවීමෙන් අනතුරුව 2022/12/08 දින සිට වෙනි දින සිට 2022/12/21 වෙනි දින ප:ව 3.00 දක්වා ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් හෝ හම්බන්තොට ධීවර වරායෙන් ලබා ගත හැක.

එම මිල ගණන් අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15 පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ඉහත ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් 2022/12/22 වන දින ප:ව 2.00 ට ප්‍රථම එවිය යුතුය.

මිල ගණන් ඉදිරිපත් කිරීමේදි ඔබ විසින් හම්බන්තොට ධීවර වරායෙන් ඉවත් කරනු ලබන වැලි කියුබ් එකක මිල ද පැහැදිලිව සඳහන් කලයුතු අතර ඉවත් කරනු ලබන වැලි කියුබ් ප්‍රමාණයද සඳහන් කළයුතුය.

හම්බන්තොට ධීවර වරායේ කැණිම්කර ගොඩගසා තිබෙන වැලි විකිණීමට ක්‍රමවත් ක්‍රම වේදයක් තිබිය යුතු අතර අදාල වැලි ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය බලපත්‍ර භූවිද්‍යා හා පතල් කාර්යාංශය වෙතින් ඔබ විසින් ලබා ගත යුතුය .

මිළ ගණන් ඉදිරිපත්කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ “ වැලි විකිණීම - හම්බන්තොට” යනුවෙන් සඳහන් කල යුතුය.

මිළ ගණන් භාරගැනීම ප්‍රධානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සංස්ථාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතුය. මෙම මිල ගණන් 2022/12/22 දින ප:ව 2.00 ට ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේදී විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. දුරකථන අංක 0112-525063 මගින් ප්‍රසම්පාදන කළමණාකාර හෝ වරාය කළමණාකාර 047-2222431 විමසීමෙන් වැඩි විස්තර ලබා ගතහැක.

සභාපති

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක්හවුස් පටුමග,
කොළඹ 15.